අපි නිදහස් අධ්‍යාපනය රැකීමට බැඳී සිටිනවා

අධ්‍යාපනයට අයවැයෙන් වෙන් කළ මුදල් සත පහකින්වත් අඩු කරන්නේ නෑ

ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා ගුරුපත්වීම් ප්‍රදානයේදී ජනපති මහින්ද රාජපක්ෂ කියයි

(දුෂ්‍යන්ත සමරසේන)

මේ ආණ්ඩුව අධ්‍යාපනය සඳහා අය-වැයෙන් වෙන් කරන ලද මුදල් යන පහකින්වත් අඩු කරන්නේ නැහැ. සමහර උදවිය බලයට එන්න අපේ රට බාල්දු කරනවා. හැල්ලුවට ලක්කරනවා. ලෝකයේ රටවල් ඉදිරියේ දණ ගහනවා. අපි ඒවාට කලබල වෙන්න ඕනෙ නැහැ. මේ අයගේ ඉතිහාසය මේ රටේ ජනතාවට මතකයි. සමහරු අධ්‍යාපන ඇමැතිව ඉන්න කාලේ තමයි අධ්‍යාපන ධවල පත්‍රිකාව ගෙනැල්ලා මේ රටේ නිදහස් අධ්‍යාපනය විනාශ කරන්න උත්සාහ කළේ. නමුත් අපි නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කරන්නේ යැයි ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පැවැසීය.

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඉගත ප්‍රකාශය කළේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුවරුන්ට පත්වීම් ලිපි බෙදා දීම සඳහා අරලියගහ මන්දිරයේ පැවැති උත්සවයේදීය.

එහිදී වැඩිදුරටත් කතා කළ ජනාධිපතිවරයා මෙසේද පැවසීය.

ලෝකයේ තියෙන වටිනාම රස්සාවක් කරන්නයි තමුන්නාන්සේලා අද රාජ්‍ය සේවයට එන්නේ. රස්සාවක් කරලා වැඳුම් ලබන්න පුළුවන් ගුරු සේවයට විතරයි. මම මේක වෘත්තිය කියලා හඳුන්වන්න කැමැති නැහැ. මේක සේවාවක්. වැඳුම් ලබන සේවාවක්. කතාවක් තියෙනවනේ "රජකමටත් වඩා ගුරුකම උතුම්" කියලා.

හැබැයි මම ආරම්භයේදීම කියන්න ඕනෑ, රස්සාවක් කියලා හිතලා මේ සේවය කරන්න එපා. එහෙම වුණොත් සැබෑ ගුරුවරයෙක් වෙන්න බැහැ. මෙතන ඉන්නේ තරුණ පිරිසක්. ඒ නිසා මම හිතනවා අද දැඩි අධිෂ්ඨානයෙන් මේ කාරණය හිතට ගනී කියලා. යන්න ඇත පළාත්වලට, මම විශ්වාස කරනවා තමුන්නාන්සේලා ඇත පළාත්වලට යාවි කියලා.

තමුන්නාන්සේලා විශ්වවිද්‍යාලයේදී විද්‍යාපීඨයේදී අරගල කළේ කොහොමද? දුප්පත් ළමයින්ගේ, ඇත ගම්වල දරුවන්ගේ අධ්‍යාපන අයිතීන් රකින්න, සමෘද්ධිමතාව නැති කරන්න. නිදහස් අධ්‍යාපනය රැක ගන්න නේද?

ඔන්න අද මේ පත්වීම් ලබන 2599 දෙනාට ඒකට අවස්ථාව උදාවෙලා තියෙනවා. යන්න ඇත පළාත්වල පාසල්වලට. ඒ දරුවන්ගේ බුද්ධිය පාදන්න. ඔබතුමන්ලා එදා "නිදහස් අධ්‍යාපනය රැක ගනිව්" කියලා කළ අරගලය සාර්ථක කරගන්න දැන් අවස්ථාවක් ලැබිලා තියෙනවා. ඇත ගම්වලට ගිහින් දුප්පත් දරුවන්ට සාධාරණය ඉටු කරන්න. හැබැයි එහෙම නැතිව මේ පත්වීම් ලැබුණු ගමන්ම ගෙවල් ළඟ ඉස්කෝලයක් ඉල්ලලා නහයෙන් අඬන්න එපා. ලියුම් අරන් එක එක්කෙනා පස්සෙ යන්න එපා.

අපි අද විශාල අරගලයක් කරනවා. අධ්‍යාපනය නගා සිටුවන්න. රටේ මොන ප්‍රශ්න තිබුණත් අධ්‍යාපනයට වෙන් කරන ප්‍රතිපාදන ශතයක්වත් අඩු කරන්න අපේ රජය කටයුතු කරන්නේ නැහැ. මේ වසරට වඩා ඊළඟ වසරේ මුදල් වැඩි කර දෙනවා.

අපි විශ්වාස කරන්නේ අධ්‍යාපනය නගාසිටුවීම අපේ රජයේ ප්‍රකාශිත හැටියට නෙමෙයි. අප මත පැටවිලා තියෙන දැඩිවැන්ත වගකීමක් විදිහටයි මම දකින්නේ.

තවමත් සාක්ෂරතාව අතින් අපි දෙවැනි වෙන්නේ ආසියාවේ රටවල් අතරින් ජපානයට විතරයි. අපිට පුළුවන් වෙන්න ඕනෑ සාක්ෂරතාවය අතින් ලෝකේ ඉහළම තැනට එන්න. මේ සඳහා අපේ රජය දැඩි වගකීමෙන් කටයුතු කරනවා. අදින් පස්සේ තමුන්නාන්සේලාටත් ඒකට විශාල වගකීමක් පැවරෙනවා.

තමුන්නාන්සේලා දන්නවා එක පැත්තකින් අපි මේ රටේ ස්වෛරීභාවය රැක ගැනීමේ දැඩි අධිෂ්ඨානශීලී මාවතක ගමන් කරනවා.

ඒ අතරේ සමහරුන් අපේ රටේ අභිමානය හැල්ලුවට ලක්කරන්න ලෝකේ රටවල් ඉදිරියේ දන ගහනවා. අපි ඒවාට කලබල වෙන්නේ නැහැ. මේ අයගේ අභිභාෂය රටේ ජනතාවට මතකයි. සමහරු අධ්‍යාපන ඇමැතිව ඉන්න කාලේ තමයි අධ්‍යාපන ධවල පත්‍රිකාව ගෙනැල්ලා මේ රටේ නිදහස් අධ්‍යාපනය විනාශ කරන්න උත්සාහ කළේ. නමුත් අපි නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කර ගන්නවා.

මම හිතන්නේ නැහැ ලෝකේ වෙන කිසිම රටක් තියෙනවා කියලා මේ වගේ අභියෝගයන් එක්ක අධ්‍යාපනයට වාගේම සංවර්ධනයට මේ තරම් රාජ්‍ය මැදිහත්වීමක් කරන.

ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට එක බැගින් තෝරාගත් පාසල් අග්‍රගණ්‍ය පාසල් හැටියට දියුණු කිරීම ආරම්භ කරල තියෙනවා. අපි ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් ආකාරයට පාසල් දරුවන්ට දිවා ආහාර වේලක් දැන් ලබා දෙනවා.

මම විශ්වාස කරනවා ගුරුවරයාගේ සේවා අඟය කරමින් ගරුත්වය ආරක්ෂා කළ යුතුයි කියලා ඒ නිසා වෘත්තීමය ගරුත්වයක් රකින්න අවශ්‍ය පියවර අපි මේ වන විට ගෙන තිබෙනවා. අපි ගුරුවරුන්ගේ පඩි වැඩි කළා.

ගුරු පඩි වැඩි කරලා විතරක් වෘත්තීය ගරුත්වය ආරක්ෂා කරන්න බෑ. පුද්ගලික අංශයේ රැකියා කරන අය පරිහරණය කරන නවීන විද්‍යා දැනුම ගුරුවරයකු ළඟ නැත්නම් එයාට සමාජයේ පිළිගැනීමක් නැතිව යනවා. ගුරුවරයා ලෝකයාත් සමග ඉදිරියට යා යුතුයි.

ඒ නිසා අපි පසුගිය අවුරුද්දේ මාර්තු මාසයේ ජාතික ගුරු පරිගණක වැඩසටහන ආරම්භ කළා. ගුරුවරුන්ගේ පරිගණක දැනුම දියුණු කරන්න. දැන් ගුරුවරයෙකුට රාජ්‍ය බැංකු තුනකින් සහන පොලියට පරිගණක දෙනවා. ඒ වගේම අපි පරිගණක පාඨමාලා නොමිලේ හැදෑරීමේ අවස්ථාව ලබා දීලා තියෙනවා.

මේ සියල්ල අපි තමුන්නාන්සේලාට දෙන්නේ මේ රට වෙනස් කරන්න. බෑ කියන්න බෑ.

මම ජීවමාන උදාහරණයක් දෙන්නම්. අනුරාධපුරේ මහවිලච්චිය ගමේ මහවිලච්චිය මහා විද්‍යාලයේ උගන්වනවා නන්දසිරි වන්නිනායක කියලා ගුරුතුමෙක්. මේ ගුරුතුමා බොහොම මහන්සිවෙලා පරිගණක ශිල්පයන් ඉංග්‍රීසි ඉගෙන ගෙන තමන් උගන්වන මුළු ඉස්කෝලෙම දරුවන්ට ඉංග්‍රීසින් පරිගණකත් ඉගැන්නුවා. මේවා පිළිබඳ අවබෝධයක් ලබා දුන්නා.

මේ බව ආරංචිවෙලා පසුගිය අවුරුද්දේ ජනධිපති ලේකම්තුමා මේ ඉස්කෝලෙට ගියා. මම ආඩම්බරයෙන් කියන්නේ මේ ගුරුතුමා ගැන. මේ පාසලේ දරුවෝ සියයට 90කට වඩා ඉංග්‍රීසි කතා කරන්න පුළුවන්. ඒ වාගේම පරිගණකයෙන් හොඳට වැඩ ගන්නත් පුළුවන්. ජනාධිපති ලේකම්තුමා ඉස්සරහා ඉංග්‍රීසි භාෂාවෙන් පරිගණක භාක්ෂණය ගැන විස්තර කරන්න ඒ මහවිලච්චිය මහා විද්‍යාලයේ දරුවන්ට පුළුවන්කම තිබුණා.

ඒ විතරක් නොවෙයි, ඒ ගමේ ගුරුතුමා හිතදා දැන් ඒ ගමේ දරුවෝ බොහොම දෙනෙක් පරිගණක පාවිච්චි කරලා අන්තර්ජාලයට යනවා. කොළඹ තියෙන සමාගම්වලට වෙබ් අඩවි හදා දෙනවා. පිටරටවල සමාගම් එක්ක පරිගණක භාවිතා කරලා වැඩ කරනවා.

හැබැයි මහවිලච්චිය ගමේ සමහර දරුවෝ කොළඹ දැනුවත්කම් නැතිව ඇති. ඒ වුණාට ඒ ගමේදරුවන්ව විශ්ව පුරවැසියෝ කරන්න නන්දසිරි වන්නිනායක කියන එක ගුරුතුමෙකුට පුළුවන් වුණා. මෙය ගුරු පරපුරට ආරම්භරයක්.

මට මේ හාස්කම අපේ ලේකම්තුමා කිව්වහම අපි හිරණය කළා "ඊ ට්ලේජ්" කියන සංකල්පය මේ රටේ ඇති කරන්න. ගිය අවුරුද්දේ අයවැයෙන් අපි මිලියන සියයක් ඒකට වෙන් කළා. මේ තමයි ගුරුවරයෙකුට කරන්න පුළුවන් හාස්කම්. මම හැම මේ පත්වීම් ලබන ගුරුවරුන්ගෙනුත් අපේ ගුරු පරපුරෙනුත් අහනවා, ඇයි ඔබට මහවිලච්චියේ නන්දසිරි ගුරුතුමා වාගේ වෙන්න බැරි.

ඇත ගමක ගුරුවරයෙක් මේ හාස්කම කළා නම් ඇයි මේච්චර පහසුකම් තියෙන කොළඹ වාගේ ප්‍රදේශවල දරුවෝ ඉංග්‍රීසි ගණිතය අසමත් වෙන්නේ. මට කියන්න කනගාටුයි දවසකට ගුරුවරු 40,000ක් නිවාඩු ගන්න බව අපේ අධ්‍යාපන අමාත්‍යාංශය හෙළිකරගෙන තියෙනවා.

ගිය අවුරුද්දේ ලක්ෂ පහකට වඩා වැඩි දරුවෝ අ.පොස.ස. සාමාන්‍ය පෙළ විභාගයට වාඩි වුණා. එයින් 25,000ක් දරුවෝ එකම විෂයෙවත් සමත් වෙලා නැහැ. ඇයි මෙහෙම වෙන්නේ?

අපි දන්නවා ගුරුවරුන්ගේ දරුවෝ බොහොම දෙනෙක් අධ්‍යාපන කඩුල්ල සාර්ථකව පනිනවා. ඒ පනින්නේ ගුරුවරු තමන්ගේ දරුවාට උගන්වන හොඳට මහන්සි වෙන නිසා.

මේ තමන්ගේ දරුවාට උගන්වන්න තියෙන කැප කිරීම ගුරුවරු තමන්ගේ පාසලේ ඉන්න දරුවන් වෙනුවෙනුත් කරනවා නම් මේ රට ලෝකයේ උසස්ම අධ්‍යාපන මට්ටමක් තියෙන රටක් බවට පත් කරන්න පුළුවන්. ඒකට සුදානම්වෙලා මේ පත්වීම බාර ගන්න ඕනෑ. මේ රට සාක්ෂරතාවයෙන් පළමුවන තැන ගන්න ඕන.

හැබැයි කියන්න කනගාටු කාරණයකුත් තියෙනවා. අපි මේ දරුවන්ට පෑන අතට දෙනකොට ප්‍රභාකරන් තුවක්කුව දෙනවා. අධ්‍යාපනය ලබාගන්න ඉන්න දරුවෝ මිනීමරන්න පුරුදු වෙනවා.

යුද්දෙට ඇදලා දානවා. ළමයින්ගේ අධ්‍යාපනය, ළමා කාලය විනාශ කරනවා. පසුගිය සතියේත් ඒල්.ටී.ටී.ඊ. නායකයන්ගේ වද විඳින්න බැරිව ළමයි හය දෙනෙක් හමුදාවට භාර වුණා. අවුරුදු දහය දොළහේ දරු පැටව්. දැනට ළමයින් 641 දෙනෙක් ඒල්.ටී.ටී.ඊ. එකෙන් පැනලා ආවිත් හමුදාවට භාර වෙලා තියෙනවා. ඒ දරුවෝ පුනරුත්ථාපනය කරලා වෘත්තීය අධ්‍යාපනයක් ලබා දෙන්න රජය කටයුතු කරනවා.

පිට රට ගිහින් මේ රටේ මානව අයිතිවාසිකම් ගැන කතා කරන උදවිය දෙමළ දරුවන්ට තුස්තවාදීන් කරන විනාශය ගැන වචනයක්වත් කියන්නේ නැහැ. ළමයි නම් හැමේම ළමයි. අපිට සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ කියලා බේදයක්නැහැ. වතුකරයේ දෙමළ මාධ්‍ය ගුරුවරුන් නෑ කිව්වාම 3700කට පත්වීම් ලබා දුන්නා. කැබිනට් පත්‍රිකා නැහැ.

දෙමළ භාෂා මාධ්‍යයෙන් ඉගෙන ගන්න දරුවන්ට පසුගිය කාලේ ගුරු හිඟයක් තිබුණා. අපි වහාම ඒක නැති කරන්න පියවර ගත්තා. උතුරු නැගෙනහිරත්, වතු පාසල්වලටත් ද්විඩ භාෂා මාධ්‍ය ගුරුවරුන්ට පත්වීම් දුන්නා.

අධ්‍යාපනයේ සම අවස්ථා සෑම දරුවකුටම තියෙන්න ඕනෑ. අපි ඒ සඳහායි වැඩ කරන්නේ.

ලෝක වෙළෙඳපොළේ පිටි වැඩි කරන පිටි අපි පිටි වැඩි කරනවා නම් මේ ආණ්ඩුව නියෙනේ මොකද්ද කියා සමහරුන් අහනවා. ත්‍රිවිධ් එකේ සිට බෙන්ස් කාරය දක්වා බදු වැඩි වෙනවා. අද ජනතාවට උනුලන්න බැරි බරක් පටවා තිබෙනවා කියා ජනතාව අපට දොස් පවරනවා. අපි මේ සියලු දේවල් පිළිබඳව අවධානය යොමුකර ජනතාවගේ බලාපොරොත්තු ඉටු කිරීමට වැඩ කරගෙන යනවා. සහන ලබාදිය යුතු අයට අපි සහන ලබාදීමට පියවර ගන්නවා.

ජාතීන් හෝ පළාත් හැටියට අධ්‍යාපනයේ විමතා කිසිවක් ඇති වෙන්න අපි ඉඩ කියන්නේ නැහැ. ගම්බද පාසල්වලට තිබුණේ අඩු අවධානයක්. අපි ඒක නැති කරගෙන යනවා.

එදා "කොළඹට කිරි ගමට කැකිරි" වෙනුවට අද " කොළඹටත් කිරි ගමටත් කිරි" කියන්න පුළුවන් වෙලා තියෙනවා. අධ්‍යාපනයට තියෙන හැම බාධාවක්ම නැති කරන්න, ඉවත් කරන්න අපි කටයුතු කරනවා.

තමුන්නාන්සේලාට අද මේ පත්වීම ලංකාවේ මොන පළාතකට ලැබුණත් ගිහින් සතුටින් සේවය කරන්න. ජාති, ආගම්, කුල භේද සලකන්න එපා. දුප්පත් පෝසත් භේද සලකන්න එපා. ඒ වගේම ළමයි පන්ති කාමරවලට සීමා කරන්න එපා. ඔවුන්ගේ හැකියාව හඳුනාගන්න, නිර්මාණශීලී දරු පරපුරක් හදන්න. දැනුමින් වගේම ආකල්ප හා කුසලතාවලින් වර්ධනය කරන්න.

තමුන්නාන්සේලාත් යාවත්කාලීන අධ්‍යාපනයක් ලබන්න. අමතර පොත පත පරිශීලනය කරන්න. අඩුම ගාණේ මාසේ පඩියටවත් පොතක් ගන්න. මාස කීපයක් යනකොට පොඩි පුස්තකාලයක් ගෙදරම හැදේවි.

"කලෝත් ගුරු සේවේ - සුවද පත නළ සේවේ" කියලා කවියක් පාරකම්බා සිරිතේ තියෙනවා. ගුරු සේවය හරියට කළොත් ඒකේ වටිනාකම, ගුණ සුවඳ හැඳෑම තියෙනවා. හොඳ ගුරුවරයෙක් වෙලා වැඩෙදායී දරු පරපුරක් රටට බිහි කරන්න ඔබට ශක්තිය ධෛර්යය ලැබේවායි කියලා මම ප්‍රාර්ථනා කරනවා.

අධ්‍යාපන ඇමැති සුසිල් ප්‍රේමජයන්ත මහතා:- මෙවර අධ්‍යාපන පීඨ ගුරුවරුන් 2,599ක් අතරින් තෝරාගත් 450 දෙනෙකුට අද පත්වීම් ලබා දෙනවා. මේ වසරට උසස් පෙළ සමත් අයගෙන් විද්‍යාපීඨ ගුරුවරුන් හැට්ටයි 3,000ක් පුහුණුවට බඳවා ගත්තා. උපාධිධාරීන්ද විභාගයකින් පසුව ගුරුවරුන් බඳවා ගන්නවා. ජාතික පාසල් සඳහා 408ක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි ගුරුවරුන් වශයෙන් සේවයේ යොදවනවා.

අපි උතුරු මැද පළාතේ ස්වේච්ඡා ගුරුවරුන් හැට්ටයි 1500ක් ස්ථිර සේවයට සුදුසුකම් මත බඳවා ගත්තා. මේ අයටත් ඉදිරියේදී පුහුණුව ලබා දීමට කටයුතු කරනවා. වතුවල දෙමළ ගුරුවරුන් සඳහා 3,779 දෙනෙක් පුළි මස අවසානයට පෙර බඳවා ගන්නවා. රජයේ ප්‍රතිපත්ති උඩ පුළි මස අවසානයට පෙර උපාධි ගුරු පත්වීම් ඇතුළුව ගුරුවරුන් 15,000ක් බඳවා ගැනීමට කටයුතු කරගෙන යනවා. ඊට ස්වේච්ඡා ගුරුවරුන්ද ඇතුළත් වෙනවා. අද පත්වීම් ලබන ගුරුවරුන්ට ජාතික වගකීමක් ඉටු කිරීමට තිබෙන බවද මෙහිදී මතක් කර දිය යුතුයි.

බස්නාහිර පළාතේ මහ ඇමැති රෙජිනෝල්ඩ් කූරේ මහතා:- මේ රටේ ගුරු වෘත්තියටත් ගුරුවරුන් දෙවිදියකට බඳවා ගන්නවා. ඒ උපාධි ගුරුවරුන් හා විද්‍යාපීඨ ගුරුවරුන් වශයෙන්. අද විද්‍යාපීඨ ගුරුවරුන්ට විශාල ඉල්ලුමක් තිබෙනවා. ගුරු වෘත්තිය කියන්නේ මාතෘ වෘත්තියයි. හැම දෙනෙක්ම බිහිවෙන්නේ ගුරුවරයෙකුගෙනුයි.

උතුරු-නැගෙනහිර පළාත්වල ගුරු හිඟයක් තියනවා. දැන් ඉදිරියේදී එයද සපුරාලීමට අධ්‍යාපන අමාත්‍යාංශය පියවර ගන්නවා.

කැලණිය විශ්වවිද්‍යාලයේ කුලපති පූජ්‍ය ආචාර්ය වැලිමිටියාවේ කුසලධම්ම හිමි පැමිණ සිටි පිරිස පංචශීලයේ පිහිටුවා විශේෂ අනුශාසනාවක්ද පැවැත්වූහ.

උත්සවය පැවැත්වීමට පෙර හින්දූ, මුස්ලිම්, කතෝලික පූජකතුමන්ලා විසින් ආගමික වතාවත් පවත්වන ලදී.

මෙම අවස්ථාවේදී බස්නාහිර පළාතේ ආණ්ඩුකාර අලෙවි මවුලානා, අධ්‍යාපන සේවා ඇමැති නිර්මල කොත්තලාවල, අධ්‍යාපන නියෝජ්‍ය ඇමැති එම්. සච්චානන්දන්, අධ්‍යාපන ලේකම් ආරියරත්න හේවගේ යන මහත්වරුන් විසින් පත්වීම් ලිපි බෙදා දෙන ලදී.

ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාර ගුරුවරුන්ට පත්වීම් ලිපි ප්‍රදානයේදී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් පැඟුරේ ප්‍රඥ්ඤසිරි හිමියන්ට සිය පත්වීම් ලිපිය ප්‍රදානය කළ අවස්ථාව (වමේ). උත්සවයට සහභාගි වූ පිරිසෙන් කොටසක් දකුණේ ඡායාරූපයෙන් දැක්වේ. (ඡායාරූපය ගයාන් අමරසේකර)

සමහර උදවිය බලයට එන්න අපේ රට බාල්දු කරනවා